# රතු ග්‍රහලෝකයක සිහිනය

හඳ අපේ කෙනෙකි. අපේ ජන කතාවල පවා "සඳට යෑම" අඩංගුවේ. අපේ විරුද්ධකාරයකු වෙතොත් අපි ඔහුව "හඳට අරින බවට" තර්ජනය කරමු. අභ්‍යවකාශය තරණය කොට සඳ ජය ගැනීම අති දුෂ්කර මෙන්ම ප්‍රබල විද්‍යා තාක්‍ෂණ ව්‍යාපෘතියක් බව සැබෑය. දශක තුනකට පමණ පෙර මිනිසා සැබැවින්ම සඳ ජයගත් අතර සඳ තරණය දැන් දින තුනක ගමනක් පමණී. අඟහරු අපට එලෙස සමීප බවත් තිබූ ග්‍රහයකු නොවේ. එහෙත් විද්‍යාඥයෝ දැන් ටික ටික අඟහරුගේ කරටද අත දමති.

මිනිසකු අඟහරු ජය ගැනීමේ ව්‍යාපෘතිය තවම සිහිනයකි.

එහෙත් සැබෑව ජය ගන්නට පෙර සිහිනය ජය ගත යුතුය. අඟහරු සිහිනයක පියවර හතරක් දැන් දකිමු.

### 1. පෘථිවියෙන් නික්ම යාම

**ගැටළුව**

සෑම අභ්‍යවකාශ යානයක්ම සිය ගමන ආරම්භ කරනුයේ ගුරුත්වාකර්ෂණයට එරෙහිව කරනු ලබන සටනකිනි. අඟහරු වෙතට දීර්ඝ කාලයක් වැයවන ගමනක් සඳහා අවශ්‍ය වන සියළු දෑ එක්තැන් කළ විට අති විශාල යානයක් නිර්මාණය වෙයි. ගුරුත්වාකර්ෂණයට එරෙහිව එම යානය එසවීම ලෙහෙසි කටයුත්තක් නොවේ.

**විසඳුම**

අභ්‍යවකාශ යානය කොටස්වලට ගලවා ඒවා වෙන වෙනම ගුවන් ගත කළහොත් ඔබේ බලශක්ති අවශ්‍යතාව එතරම් බරපතල ගැටළුවක් නොවනු ඇත. ;කාටස් වශයෙන් අහසට යන යානය අභ්‍යවකාශයේ දී නිසි පරිදි එකලස් කරගත යුතු වෙයි.

### 2. අඟහරු වෙත ගමන

**ගැටළුව**

අඟහරු වෙතට යන ගමනකට මාස හතක් ගතවේ. මෙම මුළු කාලය පුරාවටම අභ්‍යවකාශ යානය නිරතුරුව දැඩි විකිරණ රශ්මියට නිරාවරණය වේ.

**විසඳුම**

ප්‍රධානම සාධකය "යානයේ වේගය" බැවින් වේගය වැඩි කිරීම සඳහා උපක්‍රම භාවිතා කළයුතුය. "අයන ගාමනය" සහ "තාප න්‍යෂ්ඨික ගාමනය" අධි වේගය ලබා ගැනීමට උපකාරී වේ. ශක්තිමත් හා ඝනකම් ලෝහ ආවරණ භාවිතයෙන් යානයේ බර වැඩි වන බව සැබෑ නමුත් එමගින් අභ්‍යවකාශ කණ්ඩායම විකිරණවල බලපෑමෙන් බේරා ගත හැකිවෙයි.



### 3. අඟහරු මත ජීවත්වීම

**ගැටළුව**

වසර දෙක තුනක් වැනි දීර්ඝ මෙහෙවරක් සඳහා අවශ්‍ය වන ආහාර, ජලය හා ඔක්සිජන් ගබඩා කර තැබීම දුෂ්කර කටයුත්තකි.

**විසඳුම**

අඟහරු මත අයිස් ඇත්නම් ඒවා දියකර බීමට ගත හැකිය. ජලය විච්ජේදනය කර ලබා ගන්නා ඔක්සිජන් ආශ්වාසයට යොදා ගත හැකිය. කෘතිම හරිතාගාරවල ආහාර සැකසීම් සිදු කළ හැකිය.

විකිරණවලට ගොදුරුවීම වැළැක්වීමට ලෝහ හෝ පස්වලින් නිර්මාණය කළ ආවරණ සකසා ගත හැකිය.





### අඟහරු මත පැසිපන්දු ක්‍රීඩා කිරීම

මෙය පහසුව හා විනෝදය ගෙන එනු ඇත. පෘථිවියේ දී වෙහෙස දරා අඩි 3 1/2 ක උසක් පනින ක්‍රීඩකයාට, අඟහරු ග්‍රහයා මතදී පහසුවෙන්ම අඩි 9 ක පමණ උසක් පනින්නට හැකිවනු ඇත. මන්ද යත් අඟහරුගේ ගුරුත්වාකර්ෂණ බලය පෘථිවියේ මෙන් තුනෙන් පංගුවක් (1/3) පමණි.

වළල්ල පසුකර ඉහළට ගොස් පහළ එල්ලයට පන්දුව දමා ගැසිය හැකිය. එහෙත් පණ පිටින් හිඳිමින් ක්‍රීඩාව කරන්නට නම් දෙපා දෑත් කන් නාසා වැසෙන විශාල අභ්‍යවකාශ ඇඳුමක් ඇඳීම අනිවාර්යය.

ඇයි ? අඟහරු මතුපිට උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් – 63 කි. වායුගෝලයේ ඇති කාබන්ඩයොක්සයිඩ් ප්‍රතිශතය 95% කි. කොට කලිසමෙන් බැනියමෙන් ක්‍රීඩා කළහොත් මරණය නියතය.

### 4. නිවෙස් බලා ආපසු ඒම

**ගැටළුව**

ආපසු එන ගමන සඳහාද ඉන්ධන රැගෙන යාම අපහසු කාර්යයකි.

**විසඳුම**

ජල විච්ජේදනයෙන් වෙන් කර ගනු ලබන ඔක්සිජන් හා හයිඩ්‍රජන් රොකට් ඉන්ධන ලෙස භාවිත කළ හැකිය.

සෑම වසර දෙකකටම වරක් අඟහරු හා පෘථිවිය එකිනෙකට සමීපව ගමන් කරයි. අඟහරු බලා පිටත්වන හා ආපසු එන ගුවන් ගමන් මෙම අවස්ථාවේ දි නිසි එල්ලය ගෙන ආරම්භ කළ යුතු ය.



අපේ සිහිනය මෙයින් නිම වෙයි.
කෙසේ වෙතත් කවර වෙහෙසක් හෝ දරා අඟහරු වෙත ගියද, එහි සංචාරයෙන් පසුව නිරුපද්‍රිතව ආපසු ඒම සමහර විට සිහිනයක්ම වන්නටද ඉඩ තිබේ.

පරිගණක රූ රටා නිර්මාණය
මෙත්තානන්ද විතාන

හෙළ අරුත් සැකසුම
වෙබ් ප්‍රවර්ධන ඉංජිනේරු
ධර්මානන්ද විජේසිංහ